වැවිලි අමාත්‍යාංශය

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා
ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා
අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# පොල් පර්යේෂණ ආයතනය - ලුණුවිල

# පරාග සංයෝජන සහයකයින් බඳවා ගැනීම

පොල් පර්යේෂණ ආයතනයේ පුරප්පාඩු ව පවතින පරාග සංයෝජන සහයකයින් බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්** : අයදුම්කරුවන් මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවිය යුතු අතර, පොල් ගස්වල බඳිනු ලබන හැර භාවිතයෙන් පොල් ගස් නැගීමට හැකියාව පුහුණුවෙන් පසු පැවතිය යුතුයි.

**වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45 නොවැඩි පිරිමි අයවලුන් විය යුතුය.

**පුහුණුව** : වැටුප් සහිත මාසික පුහුණු කාලසීමාව සාර්ථකව නිම කිරීමෙන් පසුව සුදුසුකම්ලත් අයවලුන්ගෙන් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඔවුන් සඳහා පොල් පර්යේෂණ ආයතනය විසින් පිළිගත් සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

**වැටුප්** : මාසයකට රු. 30,000/- කට වැඩි වැටුපක් උපයාගත හැකිය. දීමනා : පැමිණීමේ දිරි දීමනාව (අත්පරාගන) දිනකට රු. 175/- , වෛද්‍යාධාර, තේ දීමනාව හිමි වේ.

**අනෙකුත් ප්‍රතිලාභ** : නිල ඇඳුම්, රාජකාරි හැඳුනුම්පත, බැංකු ණය පහසුකම්, EPF, ETF, පාරිතෝෂික දීමනා, කම්කරු වන්දි රක්ෂණ ක්‍රමය හා වෙනත් පහසුකම් ලබාදෙනු ලැබේ.

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහ ග්‍රාමසේවා සහතිකය පිටපත්, වෙනත් සුදුසුකම් සමග සම්පූර්ණ තොරතුරු ඇතුළත් කර, තමා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් 2022.03.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල ලිපිනයට එවීමට කටයුතු කරන්න. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පරාග සංයෝජන සහයකයින් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

**සභාපති,**
**පොල් පර්යේෂණ මණ්ඩලය,**
**බණ්ඩිරිප්පුව වත්ත, ලුණුවිල.**